# පරිසර සංරක්ෂණය සහ අධ්‍යාපනික හා පාරිසරික කටයුතු සඳහා වෙන් වූ මිනිසා සහ ජෛවගෝල රක්ෂිත වැඩ සටහන

එච්. ජ්. ගුණවර්ධන, නියෝජ්‍ය වන සංරක්ෂක, (පරිසර කළමණාකරන)

මිනිසා සහ ජෛවගෝල රක්ෂිත වැඩසටහන (Man and Biosphere program) පිළිබඳව අප එතරම් තොරතුරු නොදන්නේ යැයි කිවහොත් එය 1969 දී UNESCO ආයතනය මගින් දියත් කරන ලද ජාත්‍යන්තර ජෛවගෝල වැඩසටහන යටතේ ස්වාභාවික සම්පත්, බලශක්ති හා විද්‍යා කටයුතු අධිකාරිය හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික විද්‍යා සභාවේ මූලිකත්වය ඇතිව මෙම වැඩසටහන ප්‍රථමයෙන් ආරම්භකර ඇත. වර්තමානයේ ජාතික විද්‍යා පදනම මෙම වැඩසටහන මෙය සම්බන්ධීකරණය කරයි. වනජීවී, වන සංරක්ෂණ, වෙරළ සංරක්ෂණ, ජාතික ජල සම්පත් අධිකාරිය, විශ්ව විද්‍යාල ආදී සියළු ස්වාභාවික සම්පත් කළමනාකරණ කරනු ලබන හා පර්යේෂණ ආයතන එක්ව මෙම වැඩසටහන මෙහෙයවනු ලබයි.

ජෛවගෝල රක්ෂිතයක් යනු UNESCO ආයතනයේ විසින් ඔවුන්ගේ මූලික අරමුණු යටතේ පවත්වාගෙන යාමට එකඟවන පරිසර පද්ධතියක් හෝ ඒවායේ කොටසක් වේ. මෙයට ස්වාභාවික වනාන්තර, සාගර, වෙරළබඩ පරිසරය, කඩොලාන හා තෙත්බිම් ආදී පරිසර පද්ධතීන් ඇතුලත්විය හැක. 1970 දී ශ්‍රී ලංකාවේ ජෛවගෝල රක්ෂිත ජාතික කමිටුව විසින් මේ සඳහා වනාන්තර ගණනාවක් හඳුනා ගන්නා ලදී. සිංහරාජය, නකල්ස්, උඩවත්තකැලේ ආදී වනාන්තර ඇතුළුව වනාන්තර 36 ක් මෙයට අයත් විය. මෙම ප්‍රදේශ සංරක්ෂණය සඳහාම වෙන් කරන ලද සුවිශේෂ වූ ප්‍රදේශයන් වේ.

මෙම වැඩසටහනෙහි විශේෂ ලක්ෂණ වන්නේ,

* මෙම ප්‍රදේශ මිහිතලය මත ඇති යම් පරිසර පද්ධතියක නියැදියක් ලෙස සැලකිය හැකි ස්වාභාවික ප්‍රදේශයන් වේ.

* එමෙන්ම මෙම පරිසරයන් භෞමික, වෙරළ හෝ සාගර යන කුමන හෝ ප්‍රදේශයක මහජන සම්බන්ධතාවය ඇතිව තිරසාර ලෙස පවත්වාගෙන යන පරිසර පද්ධතියක් වේ.

* ජෛවගෝල රක්ෂිතයන් අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු කටයුතු සඳහා භාවිතා කරනු ලබන හෝ කළමනාකරණය කරනු ලබන පරිසර පද්ධතියක් වේ.

* එමෙන්ම රාජ්‍ය තීරකයින්, විද්‍යාඥයින්, ස්වාභාවික සම්පත් කළමනාකරුවන් එක්ව ස්වාභාවික සම්පත් සංරක්ෂණය කරමින් මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා ඉඩම් හා ජල කළමනාකරණය පිළිබඳව වැඩසටහන් සකස් කරනු ලබන ස්ථානයක් වේ.

* ස්වේච්ඡාවෙන් හා සහභාගීත්වයෙන් මිනිස් අවශ්‍යතා සපුරාලීම උදෙසා සංරක්ෂණය කරමින් පවත්වාගෙන යන ප්‍රදර්ශන බිම් ලෙස ද එම ප්‍රදේශ හැඳින්විය හැකිය.

## ජෛවගෝල රක්ෂිත කුමක් සඳහා ද?

ස්වාභාවික සම්පත් සමග මිනිසුන් සහයෝගයෙන් වෙසෙන නිදර්ශකයන් ලෙස මෙම ප්‍රදේශ සැලකිය හැකිය. ශාක හා සත්ත්ව විශේෂ මෙන්ම ප්‍රජාවන් සංරක්ෂණය කරමින් බහුවිධ ප්‍රයෝජන ගනු ලබන ආරක්ෂක කලාපයන් ලෙස සංක්ෂිප්තව සඳහන් කළ හැකිය.

ජෛවගෝල රක්ෂිත පවත්වාගෙන යාමට හේතු මෙලෙස දැක්විය හැකිය.

1. ජෛව සම්පත් සංරක්ෂණය

2. ස්වාභාවික සම්පත් සංරක්ෂණය උදෙසා පාරම්පරික දැනුම භාවිතා කරනු ලබන ආකාරය පිළිබඳව අධ්‍යයනය

3. ස්වාභාවික පද්ධති ක්‍රියාකරනු ලබන ආකාරය අධ්‍යයනය කලහැකි වීම

4. ස්වාභාවික සම්පත් සංරක්ෂණය හා මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳව අධීක්ෂණය


5. ස්වාභාවික සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම

6. දැනුම හුවමාරුව

7. ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව ගැටළු විසඳීම සඳහා දායක වීම

මෙම වැඩසටහන රටවල් 34 කින් යුත් ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුවක මග පෙන්වීම යටතේ දැනට ක්‍රියාත්මක කෙරේ. මෙයට ආසියාතික, අප්‍රිකානු, ලතින් ඇමරිකානු රටවල් මෙන්ම යුරෝපීය රටවල්ද ඇතුලත්ය. මිනිසා හා ජෛවගෝල වැඩසටහනේ ක්‍රියාකාරකම් රටවල් 110 කටත් වැඩි ප්‍රමාණයක මේ වන විට සිදුකරමින් පවතී. ඉන් රටවල් 94 ක් තුල ජෛවගෝල රක්ෂිත 391 ක් එකිනෙකට අන්තර්ජාලයක් ලෙස සම්බන්ධව ඇත.

ජෛවගෝල රක්ෂිතයක් එකිනෙකට අන්තර් සම්බන්ධිත ප්‍රධාන කළාප 03 කින් යුක්ත වේ. ඒවා පහත අයුරු දැක්විය හැකිය.




ජනාවාස(Human settlements)
R පර්යේෂණ ස්ථාන
M පසු විපරම්
E අධ්‍යයන හා පුහුණු
T සංචාරක හා සුභසාධන (Tourism and recreation)

මිනිසා හා ජෛවගෝල වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශ සංක්ෂිප්තව ගත්කල කොටස් 6 කට බෙදිය හැක.

1. වෙරළබඩ ප්‍රදේශ හා දූපත් (Coastal areas and Islands)

2. අර්ද්‍ර හා උප අර්ද්‍ර සර්ම කළාපය (Humids and Sub Humid tropics)

3. ශුෂ්ක සහ අර්ධ ශුෂ්ක ප්‍රදේශ (Arids and Semi arid Zones)

4. සෞම්‍ය හා ශීත ප්‍රදේශ (Temperate and Cold Zones)

5. නාගරික පද්ධති (Urban Systems)

6. ජෛවගෝල රක්ෂිත (Biosphere reserves)

මිනිසා සහ ජෛවගෝල වැඩසටහනේ ව්‍යුහය:

මෙම වැඩසටහන ආයතන තුනකින් පාලනය වේ.

1. ජාතික කමිටු

මිනිසා හා ජෛවගෝල වැඩසටහන දැනට ජාතික කමිටු (*National Committees*) 144 කින් මෙහෙයවනු ලබයි. මෙය (UNESCO) සාමාජික රටවල් 187 කින් ස්ථාපනය කර ඇත. මීට අමතරව MAB කමිටුවක් ඇමරිකා එක්සත් ජනපදයේ ඇත.

2. පාලන ව්‍යුහය

ප්‍රධාන පාලන ව්‍යුහය වනුයේ ජාත්‍යන්තර සම්බන්ධීකරණ සම්මේලනයයි. (International Coordination Council - ICC) මෙය UNESCO සාමාජික රටවල් 34 කින් සමන්විත අතර UNESCO ද්විවාර්ෂික මහා සම්මේලනයේදී තෝරා ගනු ලබයි. නිරීක්ෂකයන් ලෙස සාමාජික නොවන රටවල්, වෙනත් එක්සත් ජාතීන්ගේ නියෝජිතයින්, රාජ්‍ය නොවන සංවිධාන ආදිය ද මෙම සමුළුවට සහභාගී වේ.

3. මිනිසා හා ජෛවගෝල ලේකම් කාර්යාලය (MAB Secretariate)

එදිනෙදා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ වගකීම මෙම ආයතනයට පැවරේ. මෙය UNESCO හි පරිසර විද්‍යා අංශය (Division of Ecological Sceiences) ට අයත් වේ.

ජෛවගෝල රක්ෂිතයක මූලික ලක්ෂණ :

1. එය ප්‍රධාන ජෛව භූගෝලීය කළාපයක් නියෝජනය වීම

2. ජෛව විවිධත්වය අතින් වැදගත් වීම

3. කලාප මට්ටමින් තිරසාර සංවර්ධනය පිළිබඳ සමීක්ෂණය කළහැකි ප්‍රදේශයක් වීම
4. ප්‍රධාන ක්‍රියාකාරකම් තුන පිළිබිඹු කළ හැකි ගැලපෙන ප්‍රමාණයකින් යුතු වීම
5. ප්‍රධාන ක්‍රියාකාරකම් වලට ගැලපෙන ලෙස කලාප වෙන්කළ හැකි වීම
6. මහජන සම්බන්ධතාවය

රජයේ ආයතන ප්‍රාදේශීය ප්‍රජාව, පෞද්ගලික ආයතන ආදීයේ සහභාගීත්වය ලබාගත හැකි ආකාරයට කළමනාකරණ සැලසුම් හෝ ප්‍රතිපත්ති සැකසීම. මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමට නම්කල ආයතනයක් තිබීම. පර්යේෂණ, පසු විපරම් අධ්‍යාපන සහ පුහුණු සඳහා සැකසූ වැඩසටහන් තිබීම.

**මිනිසා හා ජෛවගෝල රක්ෂිත නම්කරන පිළිවෙල :**

1. අදාල රට UNESCO - MAB Secretariate (එක්සත් ජාතීන්ගේ මිනිසා හා ජෛවගෝල මහලේකම්) වෙත නාම යෝජනා ලබාදිය යුතු වේ.
2. මහලේකම් විසින් නාමයෝජනා වල ඇතුලත් දෑ ලේඛනයක් සකසනු ලබයි.
3. මෙම නාමයෝජනා ජෛවගෝල රක්ෂිත පිළිබඳ උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කරන අතර, එහිදී මිනිසා හා ජෛවගෝල රක්ෂිත ජාත්‍යන්තර සම්බන්ධීකරණ සම්මේලනය (MAB - ICC) ට නිර්දේශ සකසනු ලබයි. මිනිසා හා ජෛවගෝල රක්ෂිත ජාත්‍යන්තර සම්බන්ධීකරණ සම්මේලනය (MAB - ICC) මගින් මෙම නාමයෝජනා තෝරාගනු ලබන අතර, UNESCO ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මිනිසා හා ජෛවගෝල රක්ෂිත ජාත්‍යන්තර සම්බන්ධීකරණ සම්මේලනය හි තීරණය ප්‍රකාශයට පත්කරනු ලබයි.

**දැනට පවතින මිනිසා හා ජෛවගෝල ජාලයන්:**

යුරෝපය, උතුරු ඇමරිකාව (Euro MAB)
උප සහරානු අප්‍රිකා (Afri MAB)
නැගෙනහිර ආසියානු ජෛවගෝල රක්ෂිත ජාලය (EABRN)
ලතින් ඇමරිකන් විද්‍යා ජාලය (CYTED)
ලෙස ජාලයන් හතරකි.

**මිනිසා හා ජෛවගෝල රක්ෂිත පිළිබඳ ව්‍යාපෘති:**

විවිධ පාරිසරික ගැටළු සඳහා මෙම මිනිසා හා ජෛවගෝල වැඩසටහන් යොමු වී ඇත. මේ යටතේ මිනිසා හා ජෛවගෝල රක්ෂිත ව්‍යාපෘති පහත සඳහන් විෂයන් යටතේ ක්‍රියාත්මක කෙරේ.

1. මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් නිවර්තන හා උප නිවර්තන වනාන්තර පරිසර පද්ධති මත ඇති වී ඇති පාරිසරික බලපෑම අධ්‍යයනය කිරීම.
2. මිනිස් ක්‍රියාකාරකම් හා ඉඩම් පරිහරණ ක්‍රම මගින් උලාකෑමේ බිම් (Grazing lands) සවානා හා තණ බිම් මත ඇති වී ඇති පාරිසරික බලපෑම අධ්‍යයනය කිරීම.
3. විවිධ ඉඩම් භාවිතා ක්‍රම හා කළමනාකරණ ක්‍රම මගින් සෞම්‍ය සහ මධ්‍යධරණී කළාපීය වන භූමි දර්ශන (Tempareate and Mediterranean forest land scapes) මත ඇතිවන පාරිසරික බලපෑම අධ්‍යයන කිරීම.
4. වැව්, වගුරු, ගංගා, ඩෙල්ටා, තෙත් බිම් හා වෙරළාශ්‍රිත ප්‍රදේශවල වටිනාකම් කෙරෙහි මානව ක්‍රියාකාරකම් නිසා ඇතිවන පාරිසරික බලපෑම අධ්‍යයනය කිරීම.
5. කඳුකර හා තුන්ද්‍රා පරිසර පද්ධති කෙරෙහි මානව ක්‍රියාකාරකම්වල බලපෑම අධ්‍යයනය කිරීම.
6. වාරිමාර්ග ක්‍රමවල බලපෑම කෙරෙහි අවධානය යොමු කරමින් ශුෂ්ක හා පරිසර පද්ධතිවල විචලනය කෙරෙහි මානව ක්‍රියාකාරකම් වල බලපෑම අධ්‍යයනය කිරීම.
7. දූපත් පරිසර පද්ධතිවල පරිසර විද්‍යාව හා පාරම්පරික භාවිතයන් පිළිබඳ අධ්‍යයනය කිරීම.



8. ස්වාභාවික පරිසර හා ඒවායේ අඩංගු ජාන සම්පත් සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ

9. භෞමික හා ජලජ පරිසර පද්ධති වලට පලිබෝධ කළමනාකරණ ක්‍රම හා පොහොර භාවිතය පිළිබඳ අගැයීම

10. ප්‍රධාන ඉංජිනේරු කාර්යන් (Major engineering works) මගින් මිනිසාට හා ඔහුගෙන් පරිසරයට වන බලපෑම අධ්‍යයනය කිරීම.

11. බලශක්ති භාවිතය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් නාගරික පද්ධති වල පාරිසරික විද්‍යාත්මක කරුණු අධ්‍යයනය.

12. පරිසර දූෂණය සහ ඒ මගින් ජෛවගෝලය කෙරෙහි ඇතිවන බලපෑම පිළිබඳ පර්යේෂණ කිරීම.

13. පාරිසරික වෙනස්කම් හා මිනිස් ජාන ව්‍යුහයේ හා ස්වභාවයේ අනුවර්තනයක් අතර, අන්තර් ක්‍රියා අධ්‍යයනය කිරීම.

14. පාරිසරික ගුණාත්මක පිළිබඳ අවබෝධය ලබා ගැනීම.


මෑතකදී ජෛව විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක මෙන්ම අධ්‍යාපන හා පරිසර සංචාරක කර්මාන්තය ආදී සාධක මුල්කොට ශ්‍රී ලංකාවේ මිනිසා සහ ජෛවගෝල රක්ෂිත වැඩසටහන ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කරන ලද අතර, ඒ අනුව දිවයිනේ වනාන්තර 33 ක් මේ සඳහා නම්කර මෙම වැඩසටහනට ඇතුලත්කර ඇත. මේ අනුව විවිධ පරිසර පද්ධති, වනාන්තර, වනාන්තර වර්ග, ප්‍රමාණය හා ව්‍යාප්තිය, පරිසර සංරක්ෂණය සඳහා දායකත්වය, භූගෝලීය වටිනාකම්, ජෛව විවිධත්වය ආදී කරුණු සලකා මෙම වනාන්තර තෝරාගෙන ඇත. එම වනාන්තර ලේඛනය පහත වගුවේ දැක්වේ.

මෙයට අමතරව ජෛව විවිධත්වය, ජල විද්‍යාත්මකව හා පරිසර විද්‍යාත්මකව ඉතා වැදගත්වන වනාන්තර වන දුම්බර (නකල්ස්) සහ කන්නෙලිය, දෙදියගල, නාකියාදෙනිය වන සංකීර්ණය ජාත්‍යන්තර මිනිසා සහ ජෛවගෝල රක්ෂිත වැඩසටහන සඳහා ඇතුලත් කිරීමට යෝජනා කර ඇත.

මෙම වැඩසටහන සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමුකර ඇති අතර, UNESCO ආයතනයෙන් හා දේශීය අරමුදල් ලබාගෙන මෙම වනාන්තර වල නඩත්තු හා සංවර්ධන කාර්යයන් ඉදිරියට වඩාත් සංවිධානාත්මකව ගෙන යාමට තීරණය කර ඇත.

ශ්‍රී ලංකාවේ නව මිනිසා හා ජෛවගෝල රක්ෂිත ලේඛනය :

| *නම* | *දිස්ත්‍රික්කය* | *වනාන්තර වර්ගය* | *ප්‍රමාණය (හෙක්)* |
|---|---|---|---|
| ආනලුන්දාව | අ. පුර/පොළො | වියලි මෝසම් | 28957 |
| බඩගමුව | කුරුණෑගල | ස්වාභාවික/වන වගා මිශ්‍ර | 213 |
| දෙදියගල | මාතර | තෙත් මෝසම් වැසි | 3789 |
| දියදාව | මාතර | තෙත් මෝසම් වැසි | 2447 |
| දිගන වන උයන | මහනුවර | මිශ්‍ර වනාන්තර | 25 |
| දොලුවකන්ද | කුරුණෑගල | වියලි මෝසම් | 400 |
| ගිලීමලේ - එරත්න | රත්නපුර | තෙත් මෝසම් වැසි | 48388 |
| හේකොක් | කළුතර | පහතරට වැසි වනාන්තර | 362 |
| හුරුළු | අ/පුර, පොළො | වියළි මෝසම් | 25217 |
| කන්නෙලිය | ගාල්ල | තෙත් මෝසම් වැසි | 6024.5 |







| නම | දිස්ත්‍රික්කය | වනාන්තර වර්ගය | ප්‍රමාණය (හෙක්) |
|---|---|---|---|
| කංකානිය මුල්ල | කුරුණෑගල | තෙත් මෝසම් වැසි | 687.7 |
| නකල්ස් | මහනුවර- මාතලේ | උපකඳුකර | 18290 |
| කනුමුල්දෙනිය | හම්බන්තොට | වියලිමෝසම් | 674 |
| කිකිලියමාන | නුවරඑළිය | කඳුකර/පයිනස්/යුකැලිප්ටස් | 4580 |
| කොම්බල - කොට්ටව | ගාල්ල | පහතරට වැසි වනාන්තර | 1624.6 |
| කුරුළුකැලේ | කෑගල්ල | තෙත් මෝසම් වැසි | 9.3 |
| ලබුගම - කලටුවාව | කළුතර | පහතරට වැසි වනාන්තර | 2150 |
| මුලටියන | මාතර | පහතරට වැසි වනාන්තර | 3148.9 |
| මුත්තක්කර | ගම්පහ | කඩොලාන | 51 |
| නාගමඩු – අම්බලම (පුබුදුගම) | පුත්තලම | කඩොලාන | 245 |
| නාකියාදෙනිය | ගාල්ල | තෙත් මෝසම් වැසි | 2236 |
| නීල්ගල | මොණරාගල | සවානා/වියලි සදාහරිත | 12000 |
| නෙල්ලිකැලේ | අම්පාර | සවානා | 1152 |
| නුවරගල | අම්පාර | සවානා | 33943 |
| ඔහිය | නුවරඑළිය – බදුල්ල | උපකඳුකර/කඳුකර | 1769 |
| ඔලියගන්කැලේ | මාතර | පහතරට තෙත් වනාන්තර | 486 |
| පට්ටිපොල අඹේවෙල | නුවරඑළිය | උපකඳුකර/පයිනස්/යුකැ | 588.1 |
| රන්මලකන්ද | මාතර | උපකඳුකර/තෙත් මෝසම් | 713 |
| සීතාඑළිය | නුවරඑළිය | උප කඳුකර/පයිනස්/යුකැ | 713 |
| සිංහරාජ රත්නපුර | ගාල්ල – මාතර | උපකඳුකර/තෙත් මෝසම් | 11187 |
| උඩවත්තකැලේ | මහනුවර | තෙත් මෝසම් වැසි | 104 |
| වැඩසිටිකන්ද | මොණරාගල | සවානා | 1344 |
| යකඩවල | ගම්පහ | තෙත් මෝසම් වැසි | 20 |

මෙයට අමතරව ජෛව විවිධත්වය, ජල විද්‍යාත්මකව හා පරිසර විද්‍යාත්මකව ඉතා වැදගත්වන වනාන්තර වන දුම්බර (නකල්ස්) සහ කන්නෙලිය, දෙදියගල, නාකියාදෙනිය වන සංකීර්ණය ජාත්‍යන්තර මිනිසා සහ ජෛවගෝල රක්ෂිත වැඩසටහන සඳහා ඇතුලත් කිරීමට යෝජනා කර ඇත.

මෙම වැඩසටහන සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විශේෂ අවධානය යොමුකර ඇති අතර, UNESCO ආයතනයෙන් හා දේශීය අරමුදල් ලබාගෙන මෙම වනාන්තර වල නඩත්තු හා සංවර්ධන කාර්යයන් ඉදිරියට වඩාත් සංවිධානාත්මකව ගෙන යාමට තීරණය කර ඇත.

එච්. ඒ. ගුණවර්ධන
නියෝජ්‍ය වන සංරක්ෂක.
(පරිසර කළමනාකරණ)
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව